**නගරය සහ කඩවත් ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010 අගෝස්තු 13 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

1.2 **ගනුදෙනු, මෙහෙයුම් හා කාර්යය සාධනය පිළිබඳ අදහස් දැක්වීම.**

1.2.1 **බැංකු සැසඳුම්.**

වර්ෂ 05 ක් ඉක්ම වූ ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ රු.28,425 ක් වටිනා චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අංක 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

1.2.2 **ගෙවියයුතු ගිණුම්.**

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 03 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.23,419 ක් විය.

1.2.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**පිළිතුරු නොලත් විගණන විමසුම්.**

2011 ජුනි 30 දින වන විට විගණන විමසුම් 58 කට පිළතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.44,422,915 ක් විය.

1.2.4 **අනුකූල නොවීම්.**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි, විධි විධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේ දි නිරීක්ෂණය විය.

| | | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව. | අනුකූල නොවීම. |
|---|---|---|---|
| (අ) | | 1989 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| | (i) | Viii වන කොටසේ 178(5) පරිච්ඡේදයේ 16(1) ඡේදය. | ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය නොකර, කොන්ත්‍රාත් 58 ක් සඳහා රු.9,695,328 ක් ගෙවා තිබුණි. |
| | (ii) | 1 පරිච්ඡේදයේ 5(xi) ඡේදය | මුදල් හා ගබඩාවලට අදාළව රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (iii) | 1 පරිච්ඡේදයේ 5(xii) ඡේදය | මුදල් හා ගබඩා භාර සිටින නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් |

ඇප තැන්පතුවක් ලබා ගෙන නොතිබුණි.

| | | |
|---|---|---|
| (iv) | Xii පරිච්ඡේදයේ අංක 204 ඡේදය | සමීක්ෂණ මණ්ඩලය විසින් වර්ෂ අවසානයේ මුද්දර හා ලිපිද්‍රව්‍ය සමීක්ෂණය කර නොතිබුණි. |
| (v) | Xii පරිච්ඡේදයේ 217 වන ඡේදය | ඉඩම් හා ගොඩනැගිලි සඳහා ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

(ආ) <u>මුදල් රෙගුලාසි</u>

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි අංක 371(2) | රු.33,231 ක අග්‍රිම අදාළ නිශ්චිත කාර්යයයේ වියදම පිය වූ වහාම පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි අංක 756 | සමාලෝචිත වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි අංක 1646 | සභාව සතු වාහන 09 කට අදාළ දෛනික ධාවන සටහන් විගණනයට භාර දී නොතිබුණි. |

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>ආදායම් පරිපාලනය.</u>

2.1.1 <u>ඇස්තමේන්තු ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ හිටි ආදායම.</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 8,743 | 7,782 | 2,729 | 8,743 | 4,553 | 3,424 |
| (ii) | බදු කුළී | 1,566 | 1,280 | 518 | 3,647 | 843 | 433 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,230 | 1,198 | 25 | 911 | 867 | 08 |
| (iv) | වෙනත් ආදායම් | 30,279 | 27,312 | 674 | 27,007 | 30,733 | 2,020 |

2.1.2 <u>උසාවි දඩ මුදල්</u>

විවිධ ආඥා පනත් යටතේ ත්‍රිකුණාමල මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර, ප්‍රධාන ලේකම්, පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු.1,663,352 ක් සභාවට ලැබියයුතු උසාවි දඩ මුදල ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.1.3 <u>මුද්දර ගාස්තු.</u>

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අය විය යුතු මුදල් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.2 **විියදම් ව්‍යුහය**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 22,445 | 22,412 | 33 | 22,489 | 20,027 | 2,462 |
| අනෙකුත් | 10,414 | 5,498 | 4,916 | 7,754 | 5,397 | 2,357 |
| උප එකතුව | 32,859 | 27,910 | 4,949 | 30,243 | 25,424 | 4,819 |
| ප්‍රාග්ධන වියදම | 12,900 | 18,907 | (6,007) | 9,915 | 7,859 | 2,056 |
| මුළු එකතුව | 45,759 | 46,817 | (1,058) | 40,158 | 33,283 | 6,875 |

2.3 **මානව සම්පත් කළමණාකරණය**

2.3.1 **අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | ඌනතාවය/ අතිරික්තය |
|---|---|---|---|
| මාණ්ඩලික | 05 | 04 | 01 |
| ද්විතියික | 19 | 17 | 02 |
| ප්‍රාථමික | 42 | 40 | 02 |
| වෙනත් (අනියම්, තාවකාලික) | -- | 33 | (33) |
| එකතුව | 66 | 94 | 28 |

2.4 **වත්කම් කළමනාකරණය.**

රු.10,810,636 ක් වටිනා වාහනයක් සහ රු.32,098,745 ක් වටිනා ඉඩමක් වර්ෂ 01 ක් තිස්සේ නිෂ්ක්‍රීයව පවති.

2.4.1 **අයවීමට ඇති සේවක ණය**

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.5,487,084 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.31,054 ක් විය.

2.4.2 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා.</u>**

(අ) රු.300,000 ක් වටිනා පොත් මිල දී ගැනීම සඳහා ප්‍රසම්පාදන පර්පාටිය අනුගමනය කර නොතිබුණි.

(ආ) රු.33,331 ක අත්තිකාරම් පියවීමේ දී මාස 05 ක ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

(ඇ) නාම පුවරුවක් සැකසීම සඳහා ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය නොකර, රු.109,500 ක් ගෙවා තිබුණි.

(ඈ) පරිගණක, ජායා පිටපත් යන්ත්‍රය සහ මුද්‍රණ යන්ත්‍රයක් ප්‍රසම්පාදන පර්පාටි අනුගමනය නොකර, රු.851,300 කට මිල දී ගෙන තිබුණි.

(ඉ) රු.9,695,328 ක් වටිනාකමැති කොන්ත්‍රාත් 58 ක් සඳහා ප්‍රසම්පාදන පර්පාටිය අනුගමනය නොකර සිදුකර නොතිබුණි.

2.5 **<u>අභ්‍යන්තර විගණනය.</u>**

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

3. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) ස්ථාවර වත්කම් පාලනය